# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2255/53 – 2021 නොවැම්බර් මස 26 වැනි සිකුරාදා – 2021.11.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස – පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**2017 අංක 16 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතින් සංශෝධිත (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66ආ(2) වගන්තිය යටතේ දොම්පෙ ප්‍රාදේශීය සභාවේ උප සභාපති ධූරයේ පුරප්පාඩුව පිරවීම**

සභාපතිවරයා ලෙස තේරීපත් වීම හේතු කොට ගෙන දොම්පෙ ප්‍රාදේශීය සභාවේ උප සභාපති ධූරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 66ආ(2) වන වගන්තිය යටතේ තනතුර දැරූ උප සභාපති වන කාරියප්පෙරුමගේ පියසේන මහතා අයත් වන්නා වූ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ නම් පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහක (30) කාල පරිච්ඡේදය ඇතුළත උප සභාපති වශයෙන් තෝරා පත් කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම දොම්පෙ ප්‍රාදේශීය සභාවේ උප සභාපති පිළිබඳව තීරණය කිරීමට, මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින්ද ;

ඉහත කී ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා කැකුල් තොටුවගේ දොන් අජිත් සිසිර කුමාර මහතා නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

දොම්පෙ ප්‍රාදේශීය සභාවේ තේරීම් භාර නිලධාරි කරුණාසිංහ ජයරත්නගේ සම්පත් මාධව වන මම, 2017 අංක 16 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතින් සංශෝධිත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වන අධිකාරය වූ) 66ආ(2) වන වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, කැකුල් තොටුවගේ දොන් අජිත් සිසිර කුමාර, දොම්පෙ ප්‍රාදේශීය සභාවේ උප සභාපති වශයෙන් තෝරා පත් කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

**කේ. ජේ. එස්. මාධව,**
තේරීම්භාර නිලධාරි,
දොම්පෙ ප්‍රාදේශීය සභාව.

2021 නොවැම්බර් මස 26 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
ගම්පහ.

12-215

1A – G 35444 – 20 (2021/11)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*